RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය | ரைட் டு லைஃப் மனித உரிமைகள் நிலையம்

Since 2003
Torture Free Sri Lanka

09/06/2026

**මාධ්‍ය නිවේදනය**

**වධහිංසනයට, මර්දනයට ඉඩ දෙන යුක්තිය අපගමනය කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනු!**

යුද හමුදාවේ හිටපු බුද්ධි ප්‍රධානි මේජර් ජනරාල් සුරේෂ් සලේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමෙන් පසු වර්තමානයේ උද්ගත වී ඇති තත්ත්ව අනුව එකී පනත පිළිබඳව නැවතත් සාකච්ඡාවක් ඇති වී ඇත.

වත්මන් රජය බලයට පත් වූ පසු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා ගනු ලැබූයේ සුරේෂ් සලේ මහතා පමණක් නොවේ. ආරුගම්බේ බෝම්බ බියෙහි සිට ඊශ්‍රායලයට විරුද්ධව පෝස්ටර් ඇලවීම දක්වා ද වෙනත් කරුණු මත ද මෙම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බාධාවකින් තොරව මෙම ආණ්ඩුව බලයට පත් වී මෙම කෙටි කාලය තුළ ක්‍රියාත්මක විය.

කනගාටුවට කරුණ වන්නේ මෙම පනත ඇතුළු මර්දනකාරි අණ පනත් අහෝසි කරන බවට ජනාධිපති අනුර කුමාර දිසානායකත් වත්මන් ආණ්ඩුවත් පොරොන්දු ලබා දී බලයට පැමිණ මෙම පනත රිසි සේ භාවිත කිරීමය. ඔවුහු පොරොන්දු වූ පරිදි කිසිදු මර්දනකාරි නීතියක් හෝ පනතක් වෙනස් කිරීමට ඉවත් කිරීමට වත්මන් ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව කටයුතු කර නැත.

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනත දැනට වසර 35කටත් අධික කාලයක් තිස්සේ ලංකාවේ ක්‍රියාත්මක වෙමින් බරපතළ මානව හිමිකම් උල්ලංඝනවලට දායක වී ඇත. විශේෂයෙන් විධායකයේ නියමයෙන් රඳවා ගන්නා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් නො කොට රඳවා ගනිමින් එය මඟින් කායික හා මානසික වධහිංසනයට ලක් කිරීමත් රඳවා ගැනීම තුළ දී එම රැඳවියන් කායික හා මානසික වධහිංසනවලට ලක් කිරීමත් බරපතළ ලෙස මෙම දශක තුන තුළ ලංකාවේ සිදු වී ඇත.

මෙම පනත අහෝසි කළ යුතු බවට බරපතළ විරෝධයක් සිවිල් සමාජය ඇතුළු පුරවැසියන් සිදු කළ ද ඇතැම් ආණ්ඩු බලයට පත් වීමට පෙර මෙම පනත අහෝසි කරන බවට ප්‍රතිඥා දුන්න ද මේ දක්වා මෙම පනත අහෝසි කිරීම සිදු වී නැත. එම නිසා තවමත් පවතින මෙම මර්දනකාරි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත විවිධ පාර්ශ්ව වෙත මර්දනයේ හස්තය දිගු කරමින් පවත්වාගෙන එයි. එය මූලිකව දෙමළ සමාජයේ පිරිස් වෙත ද පසුව ජනතා විමුක්ති පෙරමුණේ කැරලිකරුවන් හෝ ජවිපෙ යැයි සැක කළ හැකි අය වෙත ද ඉන් පසුව යළිත් දෙමළ පුරවැසියන් වෙත ද, නැවතත් මුස්ලිම් ජනතාව වෙත ද යොදමින් සිටි මෙම පනත වර්තමානය වන විට නැවතත් සිංහල සමාජය වෙත ද එල්ල වී ඇත.

දින කිහිපයකට පෙර දෙමළ ගායකයකු මෙම පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති අතර ඒ සමඟ ම මේජර් ජනරාල් සලේට මෙම පනත යටතේ සිදු වූ රඳවා ගැනීමේදී සිදුවූ හිංසන පිළිබඳ අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කරන ලද්දේ අධිකරණ වෛද්‍ය වාර්තාවක් ද සමඟින්ය. එක් අතකින්

+94 112 669100
right2lifelk@gmail.com
www.right2lifelanka.org
No. 4/71, Thalakotuwa Gardens, Colombo 5, Sri Lanka.

එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය කරන ගීත ගැයුවා යැයි දෙමළ තරුණයකු ද ඒ සමඟ ම හිටපු හමුදා බුද්ධි ප්‍රධානි සලේ ද අත්අඩංගුවට ගැනීම සංකේතාත්මකය.

අධිකරණයේ මැදිහත්වීමකින් තොරව පුරවැසියකු විධායකයේ මැදිහත්වීමෙන් රඳවා තබා ගැනීම ශිෂ්ට සමාජයකට නො ගැළපෙන නීතියේ පාලනය අභියෝගයට ලක් වන සිදුවීමකි.

මෙම පනත යටතේ පුද්ගලයකු රඳවා ගැනීමට විධායකයට හිමි වන අත්තනෝමතික බලය කායික හා මානසික වධහිංසනයට ද අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලට ද හේතු වන බව අපගේ ස්ථාවරයයි.

සුරේෂ් සලේ සිදුවීම තුළ ද වධහිංසන සිදු වන බවට අධිකරණ වෛද්‍ය නිලධාරියකු විසින් වාර්තා කොට ඇති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති වධහිංසනයෙන් හා කෲර අමානුෂික හා අවමන් සහගත සැලකිලි හා දඬුවම්වලින් වැළකීමේ අයිතිය යටතට මානසික වධහිංසනය ද ඇතුළත් බව අප අවධාරණය කරමු.

මැතකදී මෙම මර්දනකාරි පනත යටතේ අත්අඩංගුවට ගත් දෙමළ ගායන ශිල්පියා පිළිබඳ සිදුවීම ද ඇතුළු බොහෝ අවස්ථාවලදී බාධාවකින් තොරව මෙම පනත භාවිත කිරීම පසුගිය කාලය පුරාවට දක්නට ලැබුණි.

විශේෂයෙන් ඊශ්‍රායලයට එරෙහිව පෝස්ටරයක් ඇලවීම හේතුවෙන් මෙම පනත යටතේ අත්අඩංගුවට ගත් තරුණයාගේ සිදුවීමේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව පැහැදිලි නිර්දේශ පොලිසියේ අදාළ අංශ වෙත ලබා දී ඇති බව ද අපි සිහිපත් කරමු.

අවස්ථා කිහිපයකදී මෙම පනත අහෝසි කර වෙනත් පනතක් මේ සඳහා ආදේශ කිරීමේ උත්සාහ වත්මන් ආණ්ඩුව ඇතුළු විවිධ ආණ්ඩු විසින් ගනු ලැබුව ද එකී පනත්හි ඇති ඇතැම් තවදුරටත් මර්දනකාරි වන නීති හේතුවෙන් ඒවා යථාර්ථයක් නො වුණි. වර්තමාන ආණ්ඩුව ද විශේෂඥ කමිටුවක යෝජනා අනුව නව ත්‍රස්ත විරෝධී නීති කෙටුම්පතක් ඉදිරිපත් කර ඇති පසුබිමක ආණ්ඩුව වහාම ඒ පිළිබඳ සිවිල් සමාජය සමඟ සාකච්ඡාව යළිත් ආරම්භ කළ යුතු බව අපගේ අදහසයි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල මාර්ගෝපදේශ අනුව මානව හිමිකම් ගරු කරන පුළුල් අධිකරණ අධීක්ෂණයක් සහිත නව ත්‍රස්ත විරෝධී නීතියක් අවශ්‍ය බව මෙම සියලු සිදුවීම් පෙන්වා දෙයි. ඒ සඳහා වහා පුළුල් මහජන කතිකාවක් ඇති කළ යුතු බව අප රජයට හා සියලු පාර්ශ්වවලට අවධාරණය කරමු.

ඒ සමඟ ම අප අවධාරණය කරන්නේ මෙම මර්දනකාරි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කරන රඳවා ගැනීම් වහාම නතර කරන ලෙසත් රඳවා ගෙන ඇති පුද්ගලයන්ට මානුෂීයව සලකන ලෙසත් එම පුද්ගලයන්ට හැකි ඉක්මනින් චෝදනා පත්‍ර ගොනු කර අධිකරණවලට ඉදිරිපත් කරන ලෙසත් එසේ නොහැකි නම් ඔවුන් මුදා හරින ලෙසත්ය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වත්මන් ආණ්ඩුව මීට පෙර හඳුන්වා දුන් පරිදිම දරුණු මර්දනකාරි නීතියක් වන අතර එය අහෝසි කිරීමේ ස්වර්ණමය අවස්ථාව දැන් උදා වී ඇත.

**-රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය-**

+94 112 669100
right2lifelk@gmail.com
www.right2lifelanka.org
No. 4/71, Thalakotuwa Gardens, Colombo 5, Sri Lanka.